# ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ ඔස්ට්‍රේලියානු එකමුතුව බිහිවෙයි

ASWA
Association of Sri Lankan Writers of Australia



අනුශාසක ඩීබී කුරුප්පු ලේකම් දිලිනි ඊරියවල සභාපති ඩබ් එච් උපසේන



සභාපති ඩබ් එච් උපසේන මහතා සභාව අමතමින්



ඩේසි ඒ සිල්වා මහත්මිය සභාව අමතමින්

ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ ඔස්ට්‍රේලියානු එකමුතුවේ පළමුවෙනි හමුව පසුගිය නොවැම්බර් මස 19 වන දින නෝබල් පාක් කම්යුනිටි සෙන්ටර්හිදී ඉතා සාර්ථකව පැවැත්විණි.

එහිදී නව සාමාජිකයින් බඳවා ගැනීම, කාරක සභාවක් සහ අනෙකුත් නිලතල සඳහා පුද්ගලයින් පත් කරගැනීම සිදු වූ අතර ව්‍යවස්ථාව, ප්‍රතිපත්ති සහ ඉදිරි වැඩසටහන් පිළිබඳවද මූලික වශයෙන් සාකච්ඡා කෙරිණි.

මීලඟ හමුව "හෝ ගානා පොකුණ" සිනමා සිත්තම පිළිබඳව කෙරෙන විවරණාත්මක කථිකාවක්ද සමගින් දෙසැම්බර් මස 9 වන දින පස්වරු 7 සිට නෝබල් පාක් කම්යුනිටි සෙන්ටර් හිදී පැවැත්වීමට නියමිතය.

සාහිත්‍ය රසකාමී සියලු දෙනාට ඒ සඳහා සහභාගීවන ලෙස ලේඛකයන්ගේ සංගමය ගෞරවයෙන් ආරාධනා කර සිටියි.



ඩී බී කුරුප්පු ජගත් ජේ එදිරිසිංහ වරුණ සාවින්ද මංගල හමුව අරඹමින්

## තේරී පත් වූ නිලධාරී මණ්ඩලය

| | |
|---|---|
| අනුශාසකවරු | ඩී.බී.කුරුප්පු/ බන්දු දිසානායක |
| කැඳවුම් කරු | වරුණ සාවින්ද |
| සභාපති | ඩබ්.එච්.උපසේන |
| ලේකම් | දිලිනි ඊරියවෙල |
| භාණ්ඩාගාරික | සමන් කුලරත්න |
| උප සභාපති | ජගත් ජේ එදිරිසිංහ |
| උප ලේකම් | රෝහණ කරුණාරත්න |
| උප භාණ්ඩාගාරික | අරුණ කොළඹතන්ත්‍රී |

**කාරක සභිකයින්**

නිරාශ ගුණසේකර,
උපේක්ෂා සේනානායක,
මාලන් බණ්ඩාර කපුවත්ත,
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
මධු වර්ණකුලසූරිය



මංගල හමුවට සහභාගි වූ ලේඛක ලේඛිකාවන්ගෙන් කොටසක්

ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ ඔස්ට්‍රේලියානු එකමුතුවට එක්වීමට u.hewage@optusnet.com.au ඊමේල් ලිපිනය ඔස්සේ ඩබ් එච් උපසේන හෝ dilini.er@gmail.com ඊමේලය ඔස්සේ දිලිනි ඊරියවල හෝ අමතන්න

## බුදු වදනින් යහපත් ජන සමාජයකට

සන්නස නොවැම්බර් කළාපයේ පළ වූ "බුදු වදනින් ජන සමාජයට" ලිපිය ලියන ලද්දේ බෙරික්හි දයා විජේසූරිය මහත්මිය විසින් බව කරුණිවෙන් සළකන්න එම ලිපිය සමග ඇගේ නම පළ නොවීම පිළිබඳව අපේ කණගාටුව